# ඇමරිකානු තානාපති කාර්යාලය, කොළඹ

# ඩිජිටල් නිෂ්පාදන සම්බන්ධීකාරක - [කාන්තා/පුරුෂ]

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු.**
**ඇමරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක / අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි.**

මෙම තනතුර දරන්නා විසින්, අන්තර්ජාලය හරහා හෝ සාම්ප්‍රදායික මාධ්‍ය විකාශයන් හරහා බෙදාහරිනු ලබන තානාපති කාර්යාලයේ මහජන සම්බන්ධතා කටයුතුවලට අදාළ සියලුම දෘශ්‍ය බහුමාධ්‍ය නිර්මාණයන් සඳහා අවශ්‍ය වන අන්තර්ගතයන් නිර්මාණය කිරීම/ලබාගැනීම ඇතුලු සියලුම නිෂ්පාදන කටයුතු සිදු කළ යුතු වේ. ශ්‍රී ලංකාවේ මාධ්‍යවල ඇති දෘශ්‍ය අංග භාවිතය, බෙදාහැරීමේ නාලිකා සහ දෘශ්‍ය මාධ්‍ය පිළිබඳ මහජන මතය සැළකිල්ලට ගනිමින් තානාපති කාර්යාලයෙන් පිටතට නිකුත් කරන මාධ්‍ය තොරතුරු සඳහා උසස් මට්ටමේ දෘශ්‍ය කලා කෘති නිර්මාණය කළ යුතුය. ඇය/ඔහු තොරතුරු නිලධාරියාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියා කළ යුතු අතර කිසිදු අධීක්ෂණ වගකීම් නොමැත.

**පූර්ණ කාලීන ව සතියකට පැය 40ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප රු. 163,449/-**

**සම්පූර්ණ කළ යුතු සුදුසුකම්:**

1. **අධ්‍යාපනය** - නිර්මාණකරණය, දැන්වීම්කරණය, ජන සන්නිවේදනය, දෘශ්‍ය කලා, පරිගණක විද්‍යාව හෝ චිත්‍රපට අධ්‍යයනය යන විෂයයන් ආශ්‍රිත සහයක උපාධියක් හෝ පූර්ණ කාලීනව වසර දෙකක විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් ලබා තිබීම අවශ්‍ය වේ.
2. **පූර්ව රැකියා පළපුරුද්ද** - අන්තර්ජාලය සහ ඒ හා සබැඳි සන්නිවේදන තාක්ෂණයන් මෙන්ම ක්ෂේත්‍රයේ සම්මත ඩෙස්ක්ටොප් හා ජංගම දුරකතන මෘදුකාංග පරිශීලකයෙක් ලෙස පුළුල් අත්දැකීම් ඇතුළුව ඩිජිටල් අලෙවිකරණය, වෙළෙඳ දැන්වීම්කරණය හෝ ජනමාධ්‍ය සඳහා දෘශ්‍ය සහ බහුමාධ්‍ය කෘති නිර්මාණය සහ නිෂ්පාදනය පිළිබඳව ද, එසේ නිර්මාණය කරන දෘශ්‍ය කෘති වෙබ් අන්තර්ගත කළමණාකරන පද්ධති (Content Managment Systems) සමඟ ඒකාබද්ධ කිරීම පිළිබඳව ද අවම වශයෙන් වසර තුනක ප්‍රගතිශීලී වගකීම් සහිත පළපුරුද්ද අවශ්‍ය වේ.
[සටහන: මෙම තනතුර සඳහා සලකා බලන අපේක්ෂකයින් දෘශ්‍ය හා බහුමාධ්‍ය සැලසුම් නිපුණතාවය සනාථ කිරීමේ ලිපි ගොනුවක් සැපයිය යුතු ය.]
3. **භාෂා ප්‍රවීණතාවය** - IV වන මට්ටමේ (ව්‍යක්ත ප්‍රවීණතාවයක්) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ. (**මෙය පරීක්ෂා කරනු ලැබේ**).
එසේම, IV වන මට්ටමේ (ව්‍යක්ත ප්‍රවීණතාවයක්) සිංහල හෝ දෙමළ කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.
4. **රැකියා දැනුම** - ග්‍රැෆික් නිර්මාණය, ශ්‍රව්‍ය දෘශ්‍ය කෘති නිෂ්පාදනය සහ වෙනත් දෘශ්‍ය අන්තර්ගත නිර්මාණය පිළිබඳ විශිෂ්ට නිර්මාණාත්මක කුසලතා සහ සවිස්තරාත්මක දැනුමක් තිබිය යුතු ය. ඉලක්කගත ප්‍රේක්ෂකයින්ගේ ආකල්ප සහ ඔවුන් ප්‍රිය කරන දෘශ්‍ය සන්නිවේදන කෘතිවල ආකෘති සහ ඒවා ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය. එසේම කලාපීය හා අන්තර්ජාතික සන්නිවේදන රටාවන් සහ ඒවා ශ්‍රී ලංකාවේ සන්නිවේදන වපසරියට බලපාන ආකාරය පිළිබඳව දැනුමක් තිබිය යුතු ය. ඩිජිටල් ප්‍රවර්ධන විධික්‍රම, ප්‍රේක්ෂක විශ්ලේෂණය සහ පාරිභෝගික සේවා ප්‍රමිතීන් පිළිබඳ සාමාන්‍ය භාවිත දැනුම අවශ්‍ය වේ. එමෙන්ම ව්‍යාපෘති අරමුණු, ප්‍රතිලාභ සහ ඇගයීම් ක්‍රම නිර්වචනය කිරීමේ සාමාන්‍ය දැනුම තිබිය යුතු ය.
දෘශ්‍ය මාධ්‍ය කෘති භාවිතා කිරීමට අදාළ ප්‍රකාශන අයිතීන් හා සීමාකරණයන්, නෛතික රෙගුලාසි සහ පටිපාටිගත මාර්ගෝපදේශන පිළිබඳ සවිස්තරාත්මක දැනුමක් අවශ්‍ය වේ.
5. **නිපුණතා සහ හැකියාවන්** -
    - විශ්ලේෂණ කුසලතා
    - සන්නිවේදන / පුද්ගලාන්තර සන්නිවේදන කුසලතා
    - කලමනාකරණ කුසලතා
    - තාක්ෂණික කුසලතා
    - ශ්‍රී ලංකාව පුරා සංචාරය කිරීමේ හැකියාව තිබිය යුතු ය.

**අවශ්‍ය ලේඛන :**

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතු ය**. එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාල අධ්‍යාපන සහතික
- අදාල සේවා / කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම් පත / විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)

**අයදුම් කරන ආකාරය :**

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවා ගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරී ව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**තැපැල් හෝ ඊමේල් මගින් එවනු ලබන අයදුම්පත් භාර ගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත 2021 **මාර්තු** 25 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.